## 2025-04-01 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් යාපනය දිස්ත්‍රික්කයේ ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ප්‍රමාණයක් ඇතුළත් වන උතුරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කය තුළ දැනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපිත කර තිබේ. යාපනය, කිලිනොච්චි හා මුලතිව් යන දිස්ත්‍රික්කවල වෙසෙන ජනතාවට ආගමන හා විගමන කටයුතු ආශ්‍රිත සේවාවන් ලබාගැනීම උදෙසා වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය වෙත ගමන් කිරීමේදී විශාල කාලයක් වැය කිරීමට සිදු වේ. උතුරු පළාතේ ජනතාව විශාල වශයෙන් විදේශ ගමන් බලපත්‍ර ඉල්ලුම් කර ඇති බැවින්, ඔවුන් සඳහා කඩිනම් සේවාවක් ලබා දීම පිණිස යාපනය දිස්ත්‍රික්කයේ ද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් ආරම්භ කිරීම සුදුසු බවට 2025-01-31 දින ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති යාපනය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී යෝජනා වී තිබේ. ඒ අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ යෝජිත යාපනය ප්‍රාදේශීය කාර්යාලය, යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ මෙම මාසයේදී ස්ථාපිත කිරීම පිණිස මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. හියුමන් ඇල්බියුමින් සොලියුෂන් 20% මිලිලීටර් 50 බෝතල් 340,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය

අඩු රුධිර පරිමාව (hypovolemia) සහ රුධිරයේ අඩු ඇල්බියුමින් මට්ටමට ප්‍රතිකාර කිරීම සඳහා භාවිත කරනු ලබන හියුමන් ඇල්බියුමින් සොලියුෂන් 20% මිලිලීටර් 50 බෝතල් 340,000ක් සපයා ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසුකරුවන් දෙදෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර ඇත. ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ඉන්දියාවේ M/s Reliance Life Science (Pvt) Ltd. වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. කොලිස්ටිමෙතේට් සෝඩියම් එන්නත 1,000,000 IU වයල් 150,000ක් සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය

ඇතැම් ග්‍රෑම් නෙගටිව් බැක්ටීරියා මාදිලි නිසා ඇති වන බරපතල ආසාදනවලට ප්‍රතිකාර කිරීම සඳහා භාවිතා කරන ප්‍රතිජීවක ඖෂධයක් වන කොලිස්ටිමෙතේට් සෝඩියම් එන්නත 1,000,000 IU වයල් 150,000ක් මිල දී ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 03ක් ඉදිරිපත්ව තිබේ. ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ශ්‍රී ලංකාවේ M/s Slim Pharmaceuticals (Pvt) Ltd., (Manufacturer: M/s Gufic Biosciences Ltd, India), වෙත අදාළ ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. 2025 වර්ෂය සඳහා වෛද්‍ය සැපයීම් අංශයට අවශ්‍ය ශල්‍ය ගෝස් ලබා ගැනීම

දේශීය සුළු පරිමාණ නිෂ්පාදකයින් නගා සිටුවීමේ රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ශල්‍ය ගෝස් නිත්‍ය සලාක ක්‍රමයක් යටතේ දේශීය නිෂ්පාදකයින් වෙතින් මිල දී ගනු ලබයි. 2025 වර්ෂය සඳහා වෛද්‍ය සැපයීම් අංශය වෙත ශල්‍ය ගෝස් අවශ්‍යතාව මීටර් මිලියන 30ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ශල්‍ය ගෝස් සලාක නිර්ණය කිරීමේ කමිටුව විසින් ලියාපදිංචි දේශීය නිෂ්පාදකයන් 282 දෙනෙකුගෙන් 2025 වසර සඳහා ශල්‍ය ගෝස් මීටර් මිලියන 30ක් මිල දී ගැනීම නිර්දේශ කර තිබේ. එලෙස මිල දී ගනු ලබන ශල්‍ය ගෝස් මීටරයක ස්ථාවර මිල ශ්‍රී ලංකා රුපියල් 68.97ක් ලෙස මිල කමිටුව විසින් අනුමත කර ඇත. ඒ අනුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව 2025 වර්ෂය සඳහා ශල්‍ය ගෝස් මීටර් මිලියන 30ක් එකී ස්ථාවර මිල යටතේ වෛද්‍ය සැපයීම් අංශයේ ලියාපදිංචි දේශීය නිෂ්පාදකයන් 282 දෙනෙකුගෙන් මිල දී ගැනීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. ට්‍රස්ටුසුමැබ් එන්නත් මිලිග්‍රෑම් 440න් මිලිලීටර් 20 වයල් 18,000ක් (ද්‍රාවක සමගින්) සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය

ඇතැම් පිළිකා වර්ග සඳහා ප්‍රතිකාර කිරීමට භාවිතා කරන ට්‍රස්ටුසුමැබ් එන්නත් මිලිග්‍රෑම් 440න් මිලිලීටර් 20 වයල් 18,000ක් මිල දී ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසු 4ක් ඉදිරිපත් වී ඇත. ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, ට්‍රස්ටුසුමැබ් එන්නත් මිලිග්‍රෑම් 440න් මිලිලීටර් 20 වයල් 18,000ක් (ද්‍රාවක සමගින්) සැපයීම සඳහා වන

ප්‍රසම්පාදනය සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වූ ශ්‍රී ලංකාවේ, M/s Cliniqon Biotech (Pvt) Ltd., (Manufacturer: AryoGen Pharmed, Iran) වෙත පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. දැනට ක්‍රියාත්මක 2024 අංක 36 දරන විදුලිබල පනත යළි සලකා බැලීම

2024 අංක 36 දරන විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා සුදුසු නිර්දේශ ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් විශේෂඥ කමිටුවක් පත් කර තිබේ. එම කමිටුව විසින් විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමට පියවර ගනු ලැබ ඇත. ඒ අනුව, දැනුම් හුවමාරු සැසි පැවැත්වීමටත්, අදහස් හා යෝජනා ලිඛිතව ලබා ගැනීමටත් කටයුතු කර ඇති අතර, පාර්ශ්වකරුවන් 59 දෙනෙකු විසින් අදහස් හා යෝජනා ලිඛිතව ඉදිරිපත් කර තිබේ. ඊට අමතරව, විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සපයනු ලබන සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් මෙන්ම විදුලිබල ක්ෂේත්‍රය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශ්වයන්ගෙන් ද අදහස් ලබා ගෙන ඇත. එකී අදහස් හා යෝජනා සැලකිල්ලට ගනිමින් විශේෂඥ කමිටුව විසින් 2024 අංක 36 දරන විදුලිබල පනත සඳහා යෝජිත සංශෝධන ඇතුළත් අවසන් වාර්තාව ඉදිරිපත් කර තිබේ. එකී වාර්තාවේ ඇතුළත් නිර්දේශ මත පදනම්ව, විදුලිබල පනත සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් තනතුරකට පත් කිරීම

අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ අතිරේක ලේකම් තනතුරු 05ක් අනුමතව ඇති අතර, මේ වන විට ඉන් තනතුරු 03ක් පුරප්පාඩුව පවතී. දැනට ශ්‍රී ලංකාව සඳහා වන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ හරිත දේශගුණ අරමුදලෙහි කළමනාකරණ විශේෂඥයකු වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ඒ.බී.එම්.අෂ්රෆ් මහතා එකී පුරප්පාඩුව පවතින අතිරේක ලේකම් තනතුරකට පත් කිරීම සඳහා සුදුසු බවට හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ගරු අග්‍රාමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සැලකිල්ලට ගෙන, ඒ මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම්වරයෙකු වශයෙන් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

## 08. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කිරීම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුර දැනට පුරප්පාඩුව පවතී. ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරියක වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි කේ.එස්.දිල්හානි මහත්මිය පත් කිරීම සුදුසු බවට හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, කේ.එස්.දිල්හානි මහත්මිය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරට පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

## 09. සංශෝධිත අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ දැනට ගෙවනු ලබන ප්‍රතිලාභවල වටිනාකම් ඉහළ නංවමින් එම යෝජනා ක්‍රමය සංශෝධනය කිරීම පිණිස 2025-03-17 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, සංශෝධිත අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය අංක 2429/02 දරන හා 2025-03-24 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී සංශෝධිත අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. එක්සත් රාජධානිය විසින් ශ්‍රී ලාංකිකයන් 04 දෙනෙකු වෙත සම්බාධක පැනවීම

මෑතකදී ශ්‍රී ලාංකිකයන් 04 දෙනෙකුට එරෙහිව එක්සත් රාජධානිය විසින් සම්බාධක පැනවීමට ගනු ලැබ ඇති තීරණය පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු විය. ඒ සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනය කර ගත යුතු ඉදිරි පියවර පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස පහත සංයුතියෙන් යුත් අමාත්‍ය කමිටුවක් පත් කිරීමටත්, එකී කමිටුවේ කාර්යයන් සඳහා අවශ්‍ය යැයි සැලකෙන, අදාළ විෂය පිළිබඳව ප්‍රවීණතාවක් සහිත අන් කවර හෝ නිලධාරියකුගේ/විද්වතකුගේ සේවය ලබා ගැනීම පිණිස කමිටුව වෙත බලය පැවරීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී:

* ගරු විජිත හේරත් මැතිතුමා
  විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය

* ගරු (නීතිඥ) හර්ෂණ නානායක්කාර මැතිතුමා
  අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය

* ගරු අරුණ ජයසේකර මහතා
  ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය

## 11. මියන්මාරයේ සිදු වූ භූකම්පනයෙන් විපතට පත් ජනතාව වෙත සහන සැලසීම

2025-03-28 දින සිදු වූ ප්‍රබල භූකම්පනය හේතුවෙන් මියන්මාරයේ ජනතාව දැඩි අපහසුතාවකට පත්ව ඇති අතර, මේ වන විට 2,700 දෙනෙකු පමණ මිය ගොස් ඇති බවට ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා කර ඇත. එසේම පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් අතුරුදන්ව ඇති බවත්, තවත් විශාල පිරිසක් එම සිදුවීම හේතුවෙන් අනතුරුවලට ලක් වී රෝහල්ගතව ප්‍රතිකාර ලබන බවත් වැඩිදුරටත් වාර්තා කර තිබේ. බෞද්ධ රාජ්‍යයන් දෙකක් වශයෙන් දෙරට ජනතාව අතර පවතින දිගුකාලීන සමීප සබඳතාව සැලකිල්ලට ගෙන, මියන්මාරයේ ජනතාව වෙත සහන සැලසීම සඳහා පහත සඳහන් පරිදි ශ්‍රී ලාංකික ජනතාවගේ දායකත්වය ලබා දීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී:

* ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියනයක මූල්‍ය ආධාරයක් ලබා දීම.

* මෙරට බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ මෙහෙයවීම මත රැස් කරනු ලබන ද්‍රව්‍යමය ආධාර කඩිනමින් මියන්මාරයේ ජනතාව වෙත ලබා දීම සඳහා රජයේ මැදිහත්වීම මත අවශ්‍ය පියවර ගැනීම.

  වෛද්‍යවරුන් සහ අනෙකුත් සෞඛ්‍ය කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත සහන සේවා කණ්ඩායමක් අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී මියන්මාරය වෙත යැවීම පිණිස සූදානම් කර තැබීම.

***********